# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

# පුරප්පාඩු

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ) (පුරප්පාඩු 01)

**(1) රැකියා විස්තරය**

එක් එක් ක්‍රීඩාවන්හි විනය පවත්වා ගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් අවදානම් තක්සේරු කිරීම සඳහා වාර්ෂික සහ කාර්තුමය උත්තේජක පරීක්ෂණ සැලසුම් සකස් කිරීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය වන දැනුවත් කිරීමේ අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීම, තහනම් උත්තේජක පරීක්ෂණයන් ධනාත්මක වූ පසු එම ලියකියවිලි ප්‍රතිඵල කළමනාකරණ අංශයට භාරදීම, අධීක්ෂණය කිරීම, උත්තේජක පාලන නිලධාරීන් හා උත්තේජක පාලන සහයකයින් පුහුණු කිරීම, චිකිත්සක භාවිත මුක්තිය පිළිබඳ කටයුතු අධීක්ෂණය හා ආයතනයේ අරමුණු කරා ගෙන යාම සඳහා යටත් කාර්ය මණ්ඩලය මෙහෙයවීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ නිසි පරිදි ක්‍රියාවේ යෙදවීම, ආයතනය පිහිටුවීමට අදාළ වූ පනත මගින් පවරනු ලබන කාර්යයන් හා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරා දෙනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

**(2) සුදුසුකම් හා පළපුරුද්ද**

**2.1 අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ) තනතුර සඳහා බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම.**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Master) ලබා තිබීම.

**(ආ) පළපුරුද්ද**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

**2.2 අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ) තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම. අභ්‍යන්තර අයදුම්කරුවන් :- (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකාර (MM) සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර තුන (03)ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

3. දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්ව තිබීම.

**(3) වැටුප් පරිමාණය**

HM 1-1-2025 - (රු. 140,640 - 15×4,100 - 202,140) ( වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව සිදු කෙරේ. මීට අමතරව රජය විසින් ලබා දෙන වෙනත් දීමනා ඇතුළත් වේ.)

**(4) වයස**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**(5) බඳවා ගැනීමේ ක්‍රමය**

පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු පහත සඳහන් විකල්ප අතරින් යෝග්‍ය විකල්පයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලැබිය හැකිය.

(a) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම.

(b) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම.

## අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) (පුරප්පාඩු 1)

**(1) රැකියා විස්තරය**

ආයතනය පිහිටුවීමට අදාළ වන පනත ඇතුළු අදාළ වන අනෙකුත් සියළු නීති, රෙගුලාසි අර්ථකථනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, තහනම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කරන ජාත්‍යන්තර ආයතන සමග එක්ව කටයුතු කිරීම, එම ආයතන හා එක්ව කාලානුරූපීව නීති රෙගුලාසි හා තොරතුරු යාවත්කාලීන කිරීම හා එම නියමයන් ශ්‍රී ලංකාව තුළ අනුගමනය කිරීම, තහනම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් අදාළ වන අප රටෙහි රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුක්තව කටයුතු කිරීම, ආයතනය පිහිටුවීමට අදාළ වූ පනත මගින් පවරනු ලබන කාර්යයන් හා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරා දෙනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

**(2) සුදුසුකම් හා පළපුරුද්ද**

**2.1 අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) තනතුර සඳහා බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම.**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

නීතිය/ අපරාධ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Master) ලබා තිබීම.

**(ආ) පළපුරුද්ද**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක " කළමනාකාර මට්ටමේ " තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

**2.2 අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම.**

**අභ්‍යන්තර අයදුම්කරුවන් :- (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකාර (MM) සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර තුන (03) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

3. දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්ව තිබීම.

**(3) වැටුප් පරිමාණය**

HM 1-1-2025 - (රු. 140,640 - 15×4,100 - 202,140) ( වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 අනුව සිදු කෙරේ. මීට අමතරව රජය විසින් ලබා දෙන වෙනත් දීමනා ඇතුළත් වේ.)

**(4) වයස**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**(5) බඳවා ගැනීමේ ක්‍රමය**

පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු පහත සඳහන් විකල්ප අතරින් යෝග්‍ය විකල්පයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලැබිය හැකිය.

(a) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම.

(b) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම.

## රියදුරු (පුරප්පාඩු 02)

**(1) රැකියා විස්තරය**

වාහන පිළිබඳ වගකීම හා නිසි අයුරින් ප්‍රවාහන කටයුතු පවත්වාගෙන යාමට සහාය වීම, රාජකාරී කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම, වාහන ධාවන තත්වයන්ට සුදුසු පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු කටයුතු සිදු කිරීම, ගමන් බිමන් ධාවන සටහන් පොතේ ලිවීම හා ලබා ගත් ඉන්ධන ප්‍රමාණය සටහන් කර දැක්වීම.

**(2) සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් :-**

**රියදුරු**

**2.1.1 අධ්‍යාපන සුදුසුකම්** :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

**2.1.2 ප්‍රවීණතා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම (අපේක්ෂිත ප්‍රවීණතාවන් පැහැදිලිව සඳහන් කළ යුතුය) සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

**රියදුරු**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(3) වැටුප් පරිමාණය**

PL 3 2025- රු. (43,280 - 10X 490 - 10 X 540 - 10×590-12×630-67,040)

**(4) වයස**

අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(5) බඳවාගැනීමේ ක්‍රමය**

ප්‍රසිද්ධ දැන්වීම් හෝ ජාතික පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවීමෙන් පසුව පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් පසු III ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

**(6) ඉහත තනතුරු සඳහා පොදු කොන්දේසි**

- අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

  (අපේක්ෂකයන් විසින් 8% ක් හා ආයතනය විසින් 12% ක් අර්ථ සාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායක වනු ඇත.)

- අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්පත්, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

**(7) වෙනත්**

**සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**(8) අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය**

- අයදුම්කරුවන් විසින් සහතිකපත්, චරිත සහතිකවල පිටපත්, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග ජීව දත්ත තොරතුරු ඇතුළත් තමන් විසින් සකස් කර ගත් A4 ප්‍රමාණයේ අයදුම්පත්‍රය 2026.06.16 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, 363/12, සුගතදස ස්ටේඩියම් - බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.
- එසේ නොවන සහ අසම්පූර්ණ අයදුම්පත්, භාර ගන්නා දිනයට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.**
**011-2328366**